# සුවපත් දිවියක් සඳහා විද්‍යාව

මහචාර්ය රවීන් හංවැල්ල



ග්‍රීසියට මදක් ඔබ්බෙන් කොස් නම් වූ දූපතකි. මේ දූපතේ බිහිවුණු එක් අග්‍රගන්‍ය මිනිසෙක් නොවන්නට කිසිවෙක් කොස් දූපත පිළිබඳව දැනගන්නේ නැත. ඒ බිහිවූ අග්‍රගන්‍ය මිනිසා නම් වෛද්‍ය විද්‍යාවේ පියා ලෙස හැඳින්වෙන හිපොක්‍රටීස් ය. හිපොක්‍රටීස් මෙතරම් විශේෂ ඇයි? ඔහු ජීවත් වූයේ විද්‍යාත්මක කායච්ඡේදන නැති හා ඵලදායි ඖෂධ නොමැති කලෙක ය. ඒ ක්‍රි.පූ. 462 ය. හිපොක්‍රටීස් තියුණු නිරීක්ෂකයෙකු විය. මේ නිසාම සුලබ රෝගවල රෝග ලක්ෂණ හඳුනාගැනීමට ඔහුට හැකිවිය. ඔහුගේ වැදගත් ම දායකත්වය වූයේ රෝගවලට හේතුව අත්භූත බලවේග නොව ස්වභාවික හේතු බව පෙන්වීමයි. මිනිස්සු, අපස්මාරය හුදෙක් තේරුම් ගැනීමට අපහසු තත්වයක් නිසාම දේවානුභාවයක් එයට ඇතැයි සිතති. මෙලෙස 'තේරුම් ගැනීමට නොහැකි සෑම දෙයටම දේවානුභාවයක් ඇතැයි සිතන්නට ගියහොත් දේවානුභාවය ඇති සංසිද්ධිවලට කෙළවරක් නැති වේ' යැයි හිපොක්‍රටීස් වරක් පවසා ඇත.

හිපොක්‍රටීස් ට පෙර ග්‍රීක වැසියෝ රෝගවලට හේතුව අත්භූත දේ යැයි සැලකුවෝය. මේ නිසා නිරොගිත්වය පතා එයට අධිපති දෙවිවරුන් වන ඇපොලෝ හා ඔහුගේ පුත් එස්කලේපියස් හට කැප කළ පුදබිම් සෑදූහ. නොයෙකුත් දුක්පීඩාවලින් පෙළෙන අය මෙම පුදබිම්වලට පැමිණියෝය. දෙවිවරුන් තම රෝගය සුව කර ගන්නා ක්‍රමයක් සිහිනයකින් දක්වන තෙක් ඔවුන් මෙම පන්සල්වල ලැගුම් ගෙන සිටියහ. හැබැවින්ම සමහරෙකගේ රෝග සුවවිණි. එහෙත් ඒ දේව බැල්මට නොව ස්වභාවිකවම රෝග සුවවීම නිසාය. ඔහු නිරීක්ෂණය කළ මෙම රෝගවලට හේතුව හරියාකාරවම කුමක්දැයි දැන ගැනීමට තරම් අවබෝධයක් නොතිබුණද එම හේතුව ස්වභාවික කරුණක් නිසා වියයුතු බව අනුමාන කළේය. හිපොක්‍රටීස් අපස්මාරය ගැන කතාකරමින් පැවසුවේ 'කවදා හෝ දිනයක අපස්මාරයට හේතුව සොයාගත් විට එය දේවානුභාවයෙන් සිදුනොවන බව මිනිසුන් හට වැටහෙනු ඇත' යන්නය. මෙය අපස්මාරයට පමණක් නොව මුළු විශ්වයටම අදාළය.' මෙම අනාවැකි කෙතරම් සත්‍ය දැයි ඔබ පුදුමවනු නොඅනුමානය.



හිපොක්‍රටීස්

විද්‍යාව අපගේ ශරීර සුවතාවය වැඩිකර ඇත්තේ කෙසේදැයි ප්‍රකට විද්‍යාඥයන් කිහිප දෙනෙක්ගේ ජීවිත පදනම් කරගෙන විමසා බැලීමට මම මෙම ලිපියෙන් අදහස් කරමි. විද්‍යාව යන වචනය ඇසෙත්ම ඔබට මැවෙන්නේ විද්‍යාගාරයක සුදු පාට කබා ඇඳගත් පුද්ගලයින් පිරිසක් බීකරවලට යම් යම් ද්‍රව්‍ය දමා රත් කරන දර්ශනයක්, දුරේක්ෂයක් ආධාරයෙන් ඈත අභ්‍යවකාශයේ තාරකා දෙස බලන හෝ රොකට්ටුවක් ගුවන්ගත කරන දර්ශනයක් විය හැකිය. එහෙත් මෙම දර්ශනවලින් පිළිබිඹු කෙරෙන්නේ විද්‍යාවේ එක් පැතිකඩක් පමණකි. ඒ විද්‍යාවේ පැති කඩවල් බොහොමයක් ඇති හෙයිනි. විද්‍යාව දැනුම් සම්භාරයක් මෙන්ම ක්‍රියාවලියක් ද වේ. මම එසේ ලියන්නේ ඔබට විද්‍යාව යනු පොතක ලියැවුණු කරුණු රාශියක් ලෙසට හැඟෙන්නට පුළුවන් නිසාය. විද්‍යාව යනු ඉන් ඔබ්බට ගිය දෙයකි. විශේෂයෙන් ම එහි ඇති චින්තන හා එළිදරව් කිරීමේ ක්‍රියාවලි මඟින් නොයෙකුත් තැන විසිරී ඇති දත්ත එක්කොට ලෝකය පිළිබඳව පූර්ණ හා ගැඹුරු අවබෝධයක් ලබාදේ. මෙය විද්‍යාත්මක ක්‍රමය යනුවෙන් හැඳින්වේ. විද්‍යාත්මක ක්‍රමයේ පියවර කිහිපයකි. මුලින්ම, යම්කිසි කුතුහලය ඇති කරවන සංසිද්ධියක් හොඳින් නිරීක්ෂණය කළ යුතුය. ඉන් පසුව ඒ පිළිබඳව ප්‍රශ්න නගමින් තව තවත්

තොරතුරු රැස් කළ යුතුය. මීළඟට ඒ නිරීක්ෂණයන් පාදක කොට ගෙන කල්පිතයක් ගොඩ නඟා, විය හැකි සිදුවීම් පිළිබඳව අනාවැකි පළ කරනු ලබයි. කල්පිතය පරීක්ෂා කිරීමට පරීක්ෂණයක් ගොඩ නැගීම ඊළඟ පියවරයි. මේ පරීක්ෂණවල ප්‍රතිඵල විශ්ලේෂණය කිරීමෙන් කල්පිතය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සිදු කරනු ලබයි. පැසුණු විද්‍යාඥයෙක් එතනින් නතර වන්නේ නැත. ඔහු ඉන් ඔබ්බට ගොස් පර්යේෂණය නැවත මෙහෙයවා මෙම නිරීක්ෂණ හා ප්‍රතිඵල වැරදීමක් නිසා ලැබුණේද එසේත් නැතිනම් සත්‍ය වශයෙන් වැදගත්කමක් නැතිව හුදු අහම්බෙන් ලැබුණේදැයි පරීක්ෂා කර බලයි. මෙම ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළ පසු ඒවායේ වැරදි ඇත්දැයි ක්ෂේත්‍රයේ වෙනත් විශේෂඥයින්ගේ අතින් සමාලෝචනයට භාජනය වේ. ඔවුන් ද මෙම පරීක්ෂණ අත් හදා බලා මෙම නිගමනවල නිරවද්‍යතාවය තවදුරටත් අත්හදා බලනු ලබයි. ඔබගේ සොයාගැනීම මෙම සියලු කඩයිම් සාර්ථකව පසු කළහොත් ඔබ විද්‍යාව වෙනුවෙන් කළ සේවයට ගෞරවයට පාත්‍රවනු නොඅනුමානය. ඔබගේ සොයාගැනීම ඉතාමත් වැදගත් නම් නොබෙල් ත්‍යාගය පවා ලැබිය හැකිය.

එහෙත් විද්‍යාව ගැන කතා කරද්දී ඔබ මතක තබා ගතයුතු කරුණක් නම් සියලු දේ විද්‍යාවෙන් පැහැදිලි කළ නොහැකි බවයි. එක් විද්‍යා සඟරාවක පාඨකයෙක් එහි කතෘට ලිවූ මේ වදන් පෙළෙන් එය මනාව පැහැදිලි වේ. 'සමහර ප්‍රශ්නවලට භක්තිය මඟින් පිළිතුරු දිය හැකිය. ඒ 'දෙවියන්වහන්සේ ජීවමානද?' වැනි ප්‍රශ්නයි. මේතාක් කල් සිටි හොඳම පැසිපන්දු ක්‍රීඩකයා කවුද? වැනි ප්‍රශ්න ඔබගේ මතය විමසයි. ගබ්සා නීත්‍යානුකූල කළ යුතුද? වැනි ප්‍රශ්න විවාදාත්මක වේ. අනෙක් ප්‍රශ්න නම් විද්‍යාත්මක ක්‍රමයට එක්තරා දුරකට නිශ්චයතාවයකින් සාක්ෂි මඟින් ඔප්පු කළ හැකි ප්‍රශ්නයි.'



**ඉග්නේෂශ් සෙමෙල්වේස්ගේ ස්මාරකය**

එක්තරා ප්‍රශ්නයකට විද්‍යාත්මක ක්‍රමය යෙදීමට නම් ඒ ප්‍රශ්නය පරීක්ෂා කළ හැකි විය යුතු අතර විමසා බලා ප්‍රත්‍යක්ෂ කර ගත හැකි විය යුතුය. තිබිය යුතු අන් ලක්ෂණය යන්න පෙන්වා දුන්නේ විද්‍යාඥයෙකු නොව දාර්ශනිකයෙකු වන කාල් පොපර් ය. ඔහු ඉතා සරලව පෙන්වා දුන්නේ ප්‍රශ්නයක් විද්‍යාත්මකද? නොමැතිද? යන්න එය බොරු කරන්නට හැකිද? නොහැකිද? මත රඳා පවතින බවයි. අප සියලුම හංසයන් සුදු ය යන නිරීක්ෂණය ගතහොත්, මෙම කල්පිතය ලෝකයේ නොයෙකුත් ප්‍රදේශවල හංසයන් නිරීක්ෂණය කොට විමසා බැලිය හැකිය. 16 වන සියවසේ එංගලන්ත වැසියෝ සිතා සිටියේ හංසයන් සැම විටම සුදු බවයි. එහෙත් 1697 ලන්දේසි ගවේශකයන් කළු හංසයින් ඔස්ට්‍රේලියාවෙන් සොයා ගැනීමත් සමඟ මෙම මතය බොරු කෙරිණි. ඒ අනුව ඉහත හංසයන් පිළිබඳ කල්පිතය බොරු කිරීමට අවශ්‍ය වන්නේ එක් කළු හංසයෙකු පමණි. සමහර ප්‍රශ්න එම ප්‍රශ්නයේ ස්වභාවය නිසාම විද්‍යාත්මකව බොරු කිරීමට අපහසුවේ. එවැනි ප්‍රශ්නයකට උදාහරණයක් වන්නේ 'අදෘශ්‍යමාන බලවේග තිබේද?' යන ප්‍රශ්නයයි. මෙවැනි ප්‍රශ්න කවරදාක්වත් විද්‍යාත්මකව බොරු කළ නොහැක. අපට කිව හැක්කේ මේ දක්වා පැහැදිලි සාක්ෂි නැති බව පමණකි. විද්‍යාත්මක ප්‍රශ්න කිරීම තුළින් මිනිසාට ලෝකය ගවේෂණය කිරීමට, ස්වභාව ධර්මය පාලනය කරන මූල ධර්ම සොයාගැනීමට හා ඒ දැනුම ප්‍රයෝජනයට ගෙන අපගේ එදිනෙදා ජීවිතය පහසු කර ගැනීමට හැකි වී ඇත. පහත දැක්වෙන්නේ එවන් උදාහරණ කිහිපයකි.



ඉග්නේෂශ් සෙමෙල්වේස් යනු 19 වන සියවසේ මැද භාගයේ වියෙනා මහ රෝහලේ සේවය කළ හන්ගේරියානු ජාතික නාරි හා ප්‍රසව වේද වෛද්‍යවරයෙකි. එකල රෝහලක දරුවෙකු ප්‍රසූත කිරීමෙන් පසු උණ රෝගයක් වැළඳීමෙන් මව මියයෑම සුලබ තත්වයක් විය. මෙහිදී මතක තබා ගතයුතු කරුණ වන්නේ මේ ලූවී පාස්චර් ක්ෂුද්‍ර ජීවීන් සොයා ගැනීමට පෙර කාලය බවයි. සෙමෙල්වේස් මෙම මාතෘ මරණ නිසා මහත් කණස්සල්ලට පත්වූ අතර එයට හේතුව සොයා ගැනීමට මහත් වෙහෙසක් දැරීය. මෙහිදී ඔහුට පෙනී ගිය කරුණක් වූයේ වියෙනා රෝහලේ ඇති මාතෘ වාට්ටු දෙකෙන් එකක මාතෘ මරණ ප්‍රතිශතය 10% වූ අතර අනෙක් වාට්ටුවේ එය 4% ක් බවයි. වාට්ටු දෙකේ මෙම වෙනස්කමට හේතුව කුමක්ද?

පළමුවෙන් ම කළේ වාට්ටු දෙකේ ඇති වෙනස්කම් මොනවාදැයි ඉතා සූක්ෂමව සොයා බැලීය. ඔහුට වෙනසක් හැටියට සොයා ගත හැකි වූයේ වාට්ටුවල වැඩ කරන කාර්ය මණ්ඩලයයි. එක් වාට්ටුවක ඉගෙන ගන්නා වෛද්‍ය ශිෂ්‍යයන් සිටිය අතර අනෙක් වාට්ටුවේ සිටියේ ඉගෙන

ගන්නා පවුල් සෞඛ්‍ය සේවිකාවන් ය. හෙතෙම වෛද්‍ය ශිෂ්‍යයන් කායච්ඡේදන කටයුතුවල නිරතවී අත් නොසෝදා ගැබිණි මව්වරුන් පරීක්ෂා කරන බව නිරීක්ෂණය කළේය. පවුල් සෞඛ්‍ය සේවිකාවන් කායච්ඡේදනය සිදු නොකරන නිසා මෙම උණට හේතුව මෘත ශරීරවලට සම්බන්ධ යම්කිසි දෙයක් වියයුතු යැයි සෙමෙල්වේස් නිගමනය කර වෛද්‍ය ශිෂ්‍යයන් හට ක්ලෝරීණිකෘත හුණු දියරවලින් දැත් පිරිසිදු කරගන්නා ලෙසට උපදෙස් දුණි. මෙම ක්‍රියාවලිය නිසා මරණ සංඛ්‍යාව 90% කින් පහත වැටුණි. මෙම අති සාර්ථක ප්‍රතිඵල නිසා සෙමෙල්වේස් ගෞරවයට පාත්‍ර වී දැත් සේදීම අනිවාර්ය දෙයක් බවට පත්වන්නට ඇතැයි ඔබ සිතන්නට ඇත. එහෙත්, එය එසේ නොවුණි. මිනිසුන් සාමාන්‍යයෙන් වෙනස්වීමට අකමැති නිසාත් අලුත් දේ වහා පිළි නොගන්නා නිසාත් මෙම ක්‍රියාපිළිවෙතට පිළිගැනීමක් නොලැබුණු අතර සෙමෙල්වේස් ව සේවයෙන් පහකරන ලදී. මේ නිසා තවත් කාන්තාවෝ බොහෝ දෙනෙකු මිය ගියහ. මෙහි



ප්‍රතිඵලයක් ලෙසට සෙමෙල්වේස් මානසික අවපීඩනයට ගොදුරුවූ අතර ඔහු 1864 දී මිය යනවිට වයස අවුරුදු 47 ක් පමණි. පසු කාලීනව මෙම මව්වරුන්ගේ ගැළවුම්කරුගේ ස්මාරකයක් 1904 දී හංගේරියාව විසින් ඉදිකරන ලදී.

සෙමෙල්වේස් වැන්නවුන්ගේ පරීක්ෂණ නිසා ලෙඩ රෝගවලට පාදකවන, පියෙවි ඇසට නොපෙනෙන ජීවී කොට්ඨාසයක් ගැන විද්‍යාඥයෝ සිතන්නට වූහ. මුලදී විෂ බීජ ගැන වූ මෙම න්‍යාය පිළිගැනීමට කවුරුත් මැලි වූහ. ඇරිස්ටෝටල්ගේ සිට අවුරුදු දෙදහසක කාලයක් තුළ ජීවය ඕපපාතිකව උපදින බව පිළිගත් මතය විය. ඔවුන් සිතා සිටියේ මැක්කන් දූවිල්ලෙනුත් ඉහඳ පණුවන් මැරුණු අයගේ මස්වලිනුත් ඉපදෙන බවයි.



ඇලෙක්සැන්ඩර් ෆ්ලෙමින්



ලූවී පාස්චර්

මෙම දුර්මතය බිඳ දමා විෂබීජ පිළිබඳ න්‍යාය සනාථ කළේ තවත් විශිෂ්ඨ විද්‍යාඥයෙක් වන ප්‍රංශ ජාතික ලූවී පාස්චර් ය. ඔහු, කැඳ ස්වල්පයක් හොඳින් නටවා සීල් කළහොත් නරක්වන්නේ නැති බවත් එයට වාතය හා මිශ්‍ර වූ යම්කිසි දෙයක් එකතු කළහොත් නරක්වන බවත් පෙන්නුම් කළේය. ඔහු ප්‍රංශයේ වයින් කර්මාන්තය විනාශ මුඛයෙන් බේරා ගැනීමට මෙම දැනුම භාවිත කළේය. තමන්ගේ වයින් ඇඹුල් රහක් ගන්නා බවට වයින් නිෂ්පාදනකරුවන් පාශ්චර්ට දැන්වූ විට ඒ විෂබීජයක් නිසා බවත් වයින් සෙල්සියස් අංශක 60ට රත්කළවිට එසේ නොවන බවත් සනාථ කළේය. මෙම ක්‍රමය පැශ්චරීකරණය ලෙසට හැඳින්වෙන අතර අදටත් කිරි හා බීර කල්තබා ගැනීමට භාවිත කරයි.

රත් කිරීම තුළින් ආහාරවල විෂ බීජ නැසිය හැකි ආකාරයටම ශරීරයට ඇතුළුවන විෂබීජ මර්දනය සඳහා ප්‍රථම ප්‍රතිජීවක ඖෂධය වන පෙනිසිලින්



සොයා ගත්තේ ස්කොට්ලන්ත ජාතික ඇලෙක්සැන්ඩර් ෆ්ලෙමින් ය. ඔහු තම බැක්ටීරියා සහිත පෙට්‍රි දීසියක එක්තරා පුස් වර්ගයක් ඇති බවත් එම පුස් වර්ගය ඇති තැන්වල බැක්ටීරියාව වර්ධනය වී නොමැති බවත් නිරීක්ෂණය කළේය. ඔහු එම පුස්වලින් යම්කිසි දෙයක් ස්‍රාවය කරන බවට අනුමාන කළ අතර එය "පෙනිසිලින්" ලෙස නම් කළේය. එහෙත් මිනිසුන්ට මෙම ඖෂධය ලබාදී පරීක්ෂා කිරීමට තරම් ප්‍රමාණවත් පෙනිසිලින් සෑදුවේ ඊට අවුරුදු ගණනාවකට පසුවය. පළමු ලෝක යුද්ධයේදී උණ්ඩවලට වඩා සොල්දාදුවන් මියැදුනේ විෂබීජ ශරීරගත වීම නිසාය. එහෙත්, දෙවන ලෝක යුද්ධයේ අවසාන අවුරුද්ද වනවිට පෙනිසිලින් අවශ්‍ය ප්‍රමාණයට නිපදවා ගත හැකි වුණු අතර මේ නිසා ජීවිත ගණනාවක් බේරා ගත හැකි විය. මේ නිසා ෆ්ලෙමින්ට



සහ ඔහුගේ සගයන් දෙදෙනෙකුට නොබෙල් ත්‍යාගය හිමිවිය. චාර්ල්ස් හෙන්රි ද සොයිසා නම් වූ ප්‍රකට ශ්‍රී ලාංකික දානපතියා සුනඛයෙක් සපා කෑමෙන් 1891 දී මියගියේ ක්ෂුද්‍රජීවියෙක් රුධිරගත වීමෙනි. එවිට ඔහුගේ වයස අවුරුදු 54 කි. ඒ එකල ඔහුට දීම සඳහා ප්‍රතිවයිරස හෝ වෙනත් ප්‍රතිකාර තිබුණේ නැති නිසාය.

විද්‍යාත්මක චින්තනය නව නිපැයුම් තුළින් අපට සුවය ලබා දෙනවා පමණක් නොව ලෝකය පිළිබඳව තාර්කිකව බැලීමටත්, අනියත බිය නැති කර ගැනීමටත් ඉවහල් වේ. අප හට අපහසුවක් දැනුණද විද්‍යාත්මක චින්තනය අපව සාම්ප්‍රදායික, සංස්කෘතික හා ආගමික රාමුවෙන් මුදවා ඉන් ඔබ්බට සිතීමට පොළඹවයි. චාර්ල්ස් ඩාවින්ට වඩා අපව කැළඹවූ විද්‍යාඥයින් සිටින්නේ අතළොස්සකි. එහෙත් ඔහුගේ පරිණාමවාදය ඉදිරිපත් කර ශත වර්ෂයක් පමණ ගතව ඇතත් ඇමෙරිකාවේ සමහර විශ්ව විද්‍යාල එය ඉගැන්වීම ප්‍රතික්ෂේප කරයි. මේ පරිණාමවාදය ෆොසිල විද්‍යාව වැනි නවීන ක්‍රමවලින් තව දුරටත් න්‍යායක් නොවී ස්ථාපිත කරුණක් හැටියට ඔප්පු වී තිබියදීත්ය.



HMS බීගල් නෞකාව

ඩාවින් නිරීක්ෂණය කළ කරුණක් නම් සෑම ජීවියෙක්ම හුදු දෙමාපියන් දෙදෙනාගේ හිඩැස පිරවීමට අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයකින් ප්‍රජනනය කරන බවයි. එහෙත් මෙම පැටවුන් සියල්ලෝම ප්‍රජනනය කිරීමට තරම් සරු වයස වනතුරු ජීවත්වන්නේ නැත. 1836 දී ඩාවින්, HMS බීගල් නෞකාවේ අවුරුදු 5ක් පුරා ගතවුණු මහා ලෝක සංචාරයක් ආරම්භ කළේය. ඔහු විසින් මෙම සංචාරයේදී දකුණු ඇමෙරිකාව ආසන්නයේ පිහිටි දූපත් සමූහයක් වන ග්ලැපොගස් දූපත්වල දී ෆින්ච් විශේෂ 12ක් හඳුනාගන්නා ලදී. මෙම විශේෂ එකිනෙකාගෙන් වෙනස්වූයේ උන්ගේ හොටවල්වල ප්‍රමාණය හා හැඩයෙනි. මෙම වෙනස්කම් ඇතිව තිබුණේ ෆින්චයන්ට දූපතේ ඇති විවිධ ආහාරපාන ලබාගැනීමට උදව් වීමටයි. මේ නිරීක්ෂණය තුළින් ඩාවින් පරිණාමවාදයේ ස්වභාවික වරණය යන න්‍යාය ඉදිරිපත් කළේය.

ජනගහනයක් ගත් කළ එහි ජීවීන් පෙනුමෙන් සහ චර්යාවෙන් විවිධ වේ.මෙම වෙනස්කම් වාසිදායක නම් එම ජීවීන්ගේ පැවැත්මට හොඳ සාධකයක් වේ. එම ලක්ෂණ ජාන මඟින් උරුම වන ලක්ෂණ නම් ඊළඟ පරම්පරාවට ද ලැබේ. එවිට ඊළඟ පරම්පරාවල




මෙම වාසිදායක ලක්ෂණය සහිත ජීවීන් වැඩිවේ. කොළ සහ දුඹුරු කුරුමිණියන් ගතහොත් කොළ කුරුමිණියන් කුරුල්ලන්ගේ ගොදුරක් විය හැකි අවස්ථාව වැඩිය. ඒ කොළ පැහැය කැපී පෙනෙන නිසාය. මේ නිසා දුඹුරු කුරුමිණි ගහනය වැඩි වන අතර කාලයත් සමග ඉතිරිවන්නේ එම ගහනය පමණි. මෙලෙස කාලයත් සමඟ මහත්සේ වෙනස්කම්වලට භාජනයවීමෙන් නව ජීවී විශේෂ ඇතිවේ. ස්වභාවික වරණය සිදුවන්නේ මේ විස්තර කළ ආකාරයට ඉබේ මිස කිසියම් රටාවකට අනුව නොවේ. මෙවන් අදහසක් පිළිගැනීමට මිනිසුන් පැකිළුනේ තමන් යම්කිසි හේතුවක් සඳහා මවන ලද සුවිශේෂී ජීවී කොට්ඨාසයක් ලෙස මිනිසා සිතා සිටි නිසාය. තවත් ලෙසකින් කියනවා නම් තමන් කිසියම් සුවිශේෂ කාර්යයකට මවා නැති බවත් ඉබේම බිහිවී ඇතිබවත් පිළිගැනීමට මිනිසා තුළ වූ අකමැත්ත නිසාය.

අපි දැන් අපට කරදරකාරී වන ආකල්ප කිහිපයක් විද්‍යාව ඇසුරෙන් විමසා ඒ මඟින් නිරවුල්ව සිතන්නේ කෙසේදැයි හා ජීවිතය සුවසේ විඳින්නේ කෙසේදැයි විමසා බලමු. හරිහැටි තාර්කික පදනමක් නොමැති විශ්වාස හා පිළිවෙත් අන්ධ විශ්වාස වේ. එසේත් නැතිනම් අවිද්‍යාව, නොදන්නා දේ ගැන ඇති බිය, ඉබේ සිදුවන දේ ගැන හා විජ්ජා පිළිබඳ ඇති විශ්වාසය හෝ යම්කිසි දෙයකට පදනම් වන දේ පිළිබඳව ඇති දුර්මත අන්ධ විශ්වාස ලෙස අර්ථ දැක්විය හැකිය. අපල උපද්‍රව නැතිකිරීම, අනතුරු හා රෝග, සුභ ඵල ගෙන ඒම හා ලග්න ඵලාඵල කීම ශ්‍රී ලාංකික සංස්කෘතියේ කොටසක්ව පවතී. ඇස්වහ හා අදෘශ්‍යමාන බලවේගවලින් ආරක්ෂා වීමට නොයෙකුත් දේ පැළඳීම ශ්‍රී ලංකාවේ පමණක් නොව මුළු ලෝකයේම දැකිය හැකිය. අන්ධ විශ්වාසවලට ඉතිහාසය සෑහෙන දුරට බලපායි. මෙම විශ්වාස කෙමෙන් කෙමෙන් අප වෙතින් ඈත්වන බව අප සිතුවද මෙතරම් දියුණු, විද්‍යාත්මක ක්‍රමය ඔස්සේ ගමන්

ගන්නා ලෝකයක වුවද අන්ධ විශ්වාස බැහැර කිරීමට අපහසු වී ඇත. නවීන පන්නයට හැඩ ගැසුණු ඇමෙරිකාවේද තාරකා විද්‍යාඥයින් ගණනට වඩා විසි ගුණයක් වැඩියෙන් නක්ෂත්‍රකරුවෝ සිටිති. තවද මානව විකාශයට වඩා අමතර සංවේදක සංජානනය පිළිගන්නවුන් වැඩිය. හිටපු ඇමෙරිකානු ජනාධිපති රොනල්ඩ් රේගන් විශේෂ සම්මන්ත්‍රණ, ජනාධිපතිවරණ නිවේදන හා ගුවන් ගමන් සකස් කරද්දීත් නක්ෂත්‍රකරුවන්ගෙන් උදව් ලබා ගෙන තිබීමෙන් මෙය මොනවට පැහැදිළි වේ. නක්ෂත්‍රය පිළිගන්නවුන් කියන පරිදි එය විද්‍යාවක්ද? ඔවුන් කියන්නාවූ දේ විද්‍යාත්මක ක්‍රමය මඟින් පැහැදිළි කළ හැකිද? නක්ෂත්‍රය විද්‍යාවක් නම් එය විද්‍යාත්මක විමර්ශනවලට යටත්ද? එසේ විමර්ශන කර ඇත්නම් ඒවායේ ප්‍රතිඵල මොනවාද?

මේ සඳහා පරීක්ෂණ කිහිපයක් කර ඇති අතර ඉඩකඩ සීමා සහිත බැවින් එකක් පමණක් මෙහි සටහන් කරමි. 1989 දී වර්ල් මූර්ර් නැමති ඇමෙරිකානු ජාතික පර්යේෂකයා ලිපියක් පළකළේ ය. ජෝන් ගේසි යනු තරුණයින් හා පිරිමි ළමුන් 33කට වද දී මැරූ අයෙකි. ඔහුට තිබුණේ මනෝ ව්‍යාධික පෞර්ෂයකි. ඔහු තමන් ගේසි බවට හඟවා ගේසිගේ ජන්ම වේලාව සහ කේන්ද්‍රය ප්‍රකට නක්ෂත්‍රකරුවන් පස් දෙනෙකුට දී තරුණ ළමුන් හා වැඩ කරන රැකියාවක නියැලීම සුදුසු දැයි විමසුවේය. නක්ෂත්‍රකරුවන් පස් දෙනාම ඔහුට කීවේ මෙම රැකියාව ඔහුට සුදුසු බවයි. එක් අයෙක් ඔහුට තරුණ අයගේ හොඳ දේ ඉදිරියට ගත හැකි බව පැවසීය. තවත් අයෙක් ඔහු ඉතා කාරුණික හා තැන්පත් අයෙක් බව පැවසීය. තවත් අයෙක් ඔහු පසුගිය ආත්මවල ශක්තිය හොඳින් පාවිච්චි කර ඇති නිසා මේ භවයේ අන් අයට දීමට බොහෝ දේ ඇති බවත් ඔහුගේ අනාගතය ඵලදායි එකක් වන බවත් පැවසීය.

දැනට හෙළිවී ඇති දත්තවලට අනුව නක්ෂත්‍රකරුවන්ට යමෙකු උපදින විට ග්‍රහලෝක පිහිටා ඇති ආකාරය අනුව කෙනෙක් ගේ ස්වභාවය කිව නොහැකි අතර අනාගතය ගැන අනාවැකි පළකිරීමටද නොහැකිය. එහෙත් මිනිස්සු නක්ෂත්‍රය විශ්වාස කරති. නැවතත් ඩාවින් ගැන කතාකරතොත්,



ඔහු කවරදාවත් මිනිසා පැවත එන්නේ වඳුරන්ගෙන් යැයි පැසුවේ නැත. අප සියල්ලන් පැවත එන්නේ එක් ජීවියෙකුගෙන් බව පැහැදිළි වුවත් වඳුරන් වෙනතකටත් මිනිසා තව අතකටත් බෙදී ගොස් ඇත. ප්‍රවේණිගත තොරතුරු ගෙන යන්නේ ජානවලින් බව දැන් අපි දනිමු. සෛල න්‍යෂ්ඨියේ ඇති වර්ණදේහවල ජාන පිහිටා ඇත. වර්ණදේහ යුගල වශයෙන් ඇති අතර එක් වර්දේහය බැගින් මවගෙන් හා පියාගෙන් හිමිවේ. වර්ණදේහ යුගල 23ක් ඇති අතර ජාන 21,600 හඳුනාගෙන ඇත. අපගේ ස්වරූපය කෙසේද යන්න තීරණය කරන්නේ මෙම ජානයි. සමහරවිට මෙම ජාන ඉබේම විකෘතිවන අතර වර්ණදේහ, වර්ණදේහ අතරේද මාරුවීම් ඇතිවිය හැකිය. ඩාවින් කිවූ පරිද්දෙන් ස්වරූප යේ වෙනස්කම් ඇතිවන්නේ මේ නිසාය.

ඔබේ විද්‍යා පොතේ සඳහන්ව නැති කරුණක් නම් මම ඉහත පැවසූ වර්ණදේහවලට අමතරව යුගල නොවූ තවත් වර්ණදේහයක් සෛලක මයිටකොන්ඩ්‍රියම නැමති ඉන්ද්‍රිකාවේ ඇති බවයි. මයිටකොන්ඩ්‍රියම සෛලප්ලාස්මයේ පිහිටා ඇති අතර ශක්තිය නිපදවන්නේ එයයි. ප්‍රජනනයේදී පියා විසින් සෛල න්‍යෂ්ඨිය ලබා දෙන අතර මයිටකොන්ඩ්‍රියම ඇතුළු ඉතිරි කොටස් සපයන්නේ මවයි. මේ නිසා මයිටකොන්ඩ්‍රියමේ ඇති වර්ණදේහය මවගෙන් දුවකට පමණක් ලැබේ. මේ මඟින් නොයෙකුත් ගෝත්‍රවල ආයු කාලය සොයාගත හැකිය. 2008දී ගෝත්‍ර 51ක් යොදා ගනිමින් කරන ලද පර්යේෂණයකින් සොයා ගැනුනේ නූතන මානවයා සහරා කාන්තරයට ඔබ්බෙන් ජීවත්වුණු ගෝත්‍රයකින් පැවත එන බවයි. ඔවුන් උතුරට හා නැගෙනහිර දෙසට ගමන්ගෙන ලෝකය පුරා පැතිර ඇත. මෙම මතය බොහෝ ජාන විද්‍යාඥයින් පිළිගෙන ඇත.

විස්මය දනවන කරුණ වන්නේ මෙයයි: මයිටකොන්ඩ්‍රියමේ ඇති ජාන කාන්තාවකගෙන් කාන්තාවකට උරුම වන නිසා මාතෘ පෙළපතේ මුල්ම කාන්තාවන් කිහිපදෙනා පමණක් ඉතිරිවන පරිදි පරම්පරා ගණනාවක් පිටුපසට විමසිය හැකිය. දැනට ඇති තොරතුරුවලට අනුව මිනිසා පැවත එන්නේ මීට අවුරුදු ලක්ෂ දෙකකට පෙර සිටි ගැහැනියකගෙනි. දැනට ජීවත්වන අපිත් අපගේ මුතුන්මිත්තනුත් එකම මවකගෙන් පැවත ඒ. විද්‍යාව විසින් අපට ඉතා අලංකාර හා විස්මයජනක පණිවුඩයක් දී ඇත. ඒ කෙතරම් වෙනස්කම් තිබුණද මුළු ලෝකයම එකම මවකගෙන් පැවත එන එක් විශාල පවුලක් බවයි.

කොළඹ විශ්වවිද්‍යාලයේ
මනෝවිද්‍යා අංශයෙහි
**මහාචාර්ය රවීන් හංවැල්ල**
0718297008

